# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2207/14 - 2020 දෙසැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2020.12.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(රජයේ ඉඩම්හි තිබෙන කුරුඳු වගාවේ ඵලදාව නෙලාගැනීමේ අයිතිය වෙන්දේසියේ විකිණීම) මාතර දිස්ත්‍රික්කයේ උල්ලල හා කිරින්ද මගින් පහළ ගම්හි පිහිටි රජයේ ඉඩම්වල තිබෙන වගාවන්හි ඵලදාවේ අයිතිය වෙන්දේසියේ විකිණීම**

01. මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති රජයේ ඉඩමේ තිබෙන කුරුඳු ඵලදාව 2021 ජනවාරි මස 01 දිනෙන් ඇරඹී 2030 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන්වන අවුරුදු 10ක කාල පරිච්ඡේදයක් තුළ ඵලදාව නෙලා ගැනීමේ අයිතිය (අදළ කොන්දේසිවලට යටත්ව) මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් (මොහු මින් මතු ප්‍රාදේශීය ලේකම් හඳුන්වනු ලබන අතර එම පාඨය එකී ප්‍රාදේශීය ලේකම් විසින් වෙන්දේසියේ විධිපරිදි බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකු ඇතුළත් වේ) විසින් 2020 දෙසැම්බර් මස 30 වන දින පෙ.ව. 10.30ට අදළ ඉඩමේදී වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

02. ආරම්භක ලංසුව රු. 281,500.00ක් වනු ඇත. ආරම්භක ලංසුවට අඩු ලංසුවක් හෝ ආරම්භක ලංසුවට කරනු ලබන ඉල්ලීම් පිළිගනු නොලැබේ.

03. වෙන්දේසියේදී තීරණය වන ලංසුව මත වාර්ෂික බදු මුදල තීරණය වන අතර පළමු අවුරුදු 05ක කාලයකින් පසු එළඹෙන ඊළඟ වර්ෂ 05 කාලය සඳහා වාර්ෂික බදු මුදල රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත සංශෝධනය කරනු ලැබේ. එහිදී රජයේ තක්සේරුකරුගේ තක්සේරු ගත මුදල බදු ගැණුම්කරු විසින් වාර්ෂිකව ගෙවනු ලැබූ වාර්ෂික බදු මුදල අතර වෙනසක් පවතින අවස්ථාවක එම අගයන් දෙකෙන් වැඩි අගය, වාර්ෂික බදු මුදල ලෙස සලකනු ලැබේ. (වෙළෙඳ පොළෙහි කුරුඳු මිළ විශාල ලෙස පහළ බසින ලද අවස්ථාවක හෝ ස්වාභාවික ආපදා හා කෘමි පළිබෝධ හේතුවෙක් වගාවට විශාල ලෙස හානි පැමිණ ඇති බව තීරණය කරන අවස්ථාවකදී හැර)

04. කිසියම් ලංසුවක් පිළිගැනීමට පෙර එම ලංසුව තැබූ තැනැත්තාගේ නිර්ව්‍යාජත්වය හා වෙන්දේසි පිළිබඳ කොන්දේසි පිළිපැදීමට ඔහුට ඇති හැකියාව ගැන ප්‍රාදේශීය ලේකම් සෑහීමකට පත්විය යුතුය. තමා ඒ ගැන සෑහීමකට පත් නොවුවහොත් එම ලංසුව පිළිගැනීම ප්‍රතික්ෂේප කොට වෙන්දේසිය කරගෙන යාමට ප්‍රාදේශීය ලේකම්ට පුළුවන.

05. සෑම ලංසු තබන්නෙකුම තමාම පැමිණ වෙන්දේසියට පෙනී සිටිය යුතුය. තමාට පැමිණිය නොහැකි නම් නිසි පරිදි පිළිගත් නියෝජිතයකු විය යුතුය. නියෝජිතයකු විසින් ලංසු තැබෙන සියලුම අවස්ථාවන්හිදී බලය පැවරීමේ ලිපි, පරීක්ෂා කිරීම සඳහා වෙන්දේසියට පෙර කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

6. තම ලංසුව පිළිගනු ලැබූ වහාම තෝරාගනු ලැබූ ලංසුකරුවන් විසින් තම ලංසුවෙන් හරි අඩක් කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතුය. ඉතිරි කොටස වෙන්දේසිය පැවැත්වූ දින සිට සති දෙකක් ඇතුළත ගෙවිය යුතුය. තෝරා ගනු ලැබූ ලංසුකරුට ඉඩමේ භුක්තිය භාර දෙනු ලබන්නේ ලංසුවේ මුළු මුදල ගෙවූ පසු පමණකි. ලංසුව පිළිගනු ලැබූ වහාම එම ලංසුවෙන් හරි අඩක් ගෙවීමට හෝ වෙන්දේසිය පැවැත්වූ දින සිට සති දෙකක් ඇතුළත ඉතිරි මුදල ගෙවීමට ලංසුකරු අසමත් වුවහොත් වෙන්දේසිය අවලංගු කොට යම් මුදලක් ගෙවා ඇතොත් එය රාජසන්තක කිරීමට ප්‍රාදේශීය ලේකම්ට අයිතිය තිබේ.

07. තෝරාගනු ලැබූ ලංසුකරු ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබූ යම් මුදලක් වෙතොත් ඇපයක් වශයෙන් තැන්පත් කළ යුතුය. එසේ නියම කරන ලද මුදල ඔහුගේ ලංසුවේ සියයට දහය (10%)ට වැඩි නොවිය යුතුය.

08. තමා තැබූ ලංසු මුදලත්, ඇප මුදලත් ගෙවූ පසු පහත සඳහන් කොන්දේසි ඇතුළත් බලපත්‍රයක් ලැබීමට ලංසුකරුට අයිතිය ඇත්තේය.

(අ) බලපත්‍රලාභියාට ලිඛිත දැන්වීමක් මගින් මාසයක් කල්දී ප්‍රාදේශීය ලේකම් විසින් එම බලපත්‍රය ඕනෑම අවස්ථාවකදී අවසන් කළ හැක. එම ලිඛිත දැන්වීම බලපත්‍රලාභියාට පෞද්ගලිකවම හෝ ඔහු/ඇය අන්තිමට පදිංචිවී සිටි ස්ථානය හැටියට දන්නා ස්ථානයේ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් හෝ බාර දිය යුතු ය.

(ආ) ඉඩම සම්බන්ධ සියලු වරිපනම් හා අයබදු ද තක්සේරුව හා වියදම් ද බලපලාභියා විසින් ගෙවිය යුතුය.

(ඇ) බලපත්‍රලාභියා තාවකාලික ස්ථිර හෝ ගොඩනැගිලි නොහොත් ඉදිකිරීම් කිසිවක් නොකළ යුතුය.

(ඈ) බලපත්‍රලාභියා විසින් ඉඩමේ ඇති සියලුම රජයේ ඉම්ගල් මනා තත්වයෙන් තබාගත යුතුය.

(ඉ) ඉඩමේ ඇති ගස් කොළන් කැපීම, ඉවත ගෙන යාම, කවර ආකාරයකින් හෝ ඒවාට අලාභ හානි සිදුකිරීම නොකළ යුතුය.

(ඊ) මෙම ඉඩමෙන් කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම්ගේ අවසරයකින් තොරව පස්, වැලි, බොරළු හෝ වෙනත් ද්‍රව්‍ය ඉවතට ගෙන යෑම නොකළ යුතුය.

(උ) ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගෙන මිස බලපත්‍රලාභියා විසින් තමාට ඇති අයිතිය පැවරීම, අතුරු බදු දීම, උකස් කිරීම නැතහොත් වෙනත් ආකාරයකින් බැහැර කිරීම, ගනුදෙනු කිරීම නොකළ යුතුය.

(ඌ) ඕනෑම අවස්ථාවක කුරුඳු ඉඩමට ඇතුල්වී පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය ලේකම්ට හෝ ඔහු විසින් බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකුට පුළුවන.

(එ) බලපත්‍රය අවසන් වීමට පෙර ඉඩම සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් රජයට අවශ්‍ය වුවහොත් තමාට ලියවිල්ලකින් මසක් කල් දෙනු ලැබූ විට බලපත්‍රලාභියා විසින් එම සම්පූර්ණ ඉඩම නැතහොත් එම කොටස ප්‍රාදේශීය ලේකම්ට ආපසු ලැබිය යුතුය. එබඳු අවස්ථාවක දී තම එවකට ගෙවා ඇති බදු මුදලෙන් ප්‍රමාණානුකූල මුදලක් ආපසු ලබා ගැනීමටත් බලපත්‍රය නොගෙවී ඇති කාල පරිච්ඡේදය සඳහා ගෙවිය යුතු බදු මුදල අඩු කරවා ගැනීමටත් බලපත්‍රලාභියාට අයිතියක් ඇත.

(ඒ) බලපත්‍රලාභියා විසින් කොන්දේසි කඩකරනු ලැබුවහොත් කිසිම වන්දියක් නොගෙවා ඉඩමේ භුක්තිය වහාම ආපසු ගැනීමටත් ඇප මුදල සම්පූර්ණයෙන් හෝ කොටසක් රාජ සන්තක කිරීමටත් ප්‍රාදේශීය ලේකම්ට අයිතිය ඇත.

(ඔ) බලපත්‍රලාභියා විසින් කරන ලද වැඩි දියුණු කිරීම් සඳහා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ රජයෙන් වන්දියක් ලැබීමට බලපත්‍රලාභියාට අයිතියක් නැත්තේය.

(ඕ) බලපත්‍රලාභියා විසින් ඉඩමේ පවතින වගාව මනා පාලනයකින් යුතුව, එනම් වල් මර්දනය, රෝග පළිබෝධ පාලනය, නිර්දේශිත ප්‍රමාණයට අනුකූලව පොහොර යෙදීම, නුහුරු පැහීම. පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කිරීම, වගාවෙහි ප්‍රශස්ථ පදුරු ප්‍රමාණයක් පවත්වාගෙන යාම ආදී වගා ක්‍රම ක්‍රමවත්ම පවත්වාගෙන යා යුතු අතර සෑම විටම අපනයන කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි විසින් දෙනු ලබන උපදෙස් හා මග පෙන්වීම යටතේ වගාව නඩත්තු කළ යුතුය.

ඉහත උපලේඛනය

මාතර, දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ. මාස්මුල්ල ග්‍රාම නිලධාරී වසමේ උල්ලල හා කිරින්ද මගින් පහළ ගමේ පිහිටි මු.පි. මාර/704 පිඹුරෙහි කැබලි අංක 1 හා 2න් දක්වෙන ප්‍රමාණය වන අක්කර 08යි පර්චස් 24 ක් වූ පොතුකොළදෙණිය, පොතුකොළදෙණිය හේන නැමැති ඉඩම්හි පවතින කොටසෙන් අක්කර. 05, රූඩ් 03, පර්. 25ක වපසරියකින් යුත් කුරුඳු වගාව සහිත ඉඩම් කොටස් වේ.

සතර මායිම් ඃ

අංක 01 කැබැල්ල ඃ

| | | |
|---|---|---|
| උතුරට | ඃ | කැ.මැ.මු.පි. 27හි 18 හා 18බීවී ; |
| නැගෙනහිරට | ඃ | කැ.මැ.මු.පි. 27හි 26 එෆ් හා මු.පී. 704හි කැබලි අංක 02 ; |
| දකුණට | ඃ | මු.පී. 704හි කැබලි අංක 02 හා මු.පි. මාර 252 කැබලි අංක 01 හා 02 ; |
| බටහිරට | ඃ | මු.පි. මාර 252 කැබලි අංක 1, 18, 19, 18බීවී (පවතින කුරුඳු වගාවේ වපසරිය අක්. 03, රූ. 02, පර්. 19කි) |

අංක 02 කැබැල්ල

| | | |
|---|---|---|
| උතුරට | ඃ | මු.පී. 704හි කැබලි අංක 01 ; |
| නැගෙනහිරට | ඃ | මු.පී. 704හි කැබලි අංක 01 හා කැ.මැ.මු.පි. 27හි කැබලි අංක 26ඒ.වී ; |
| දකුණට | ඃ | මු.පී. 704හි කැබලි අංක 03 හා කැ.මැ.මු.පි. 27හි කැබලි අංක 26 ; |
| බටහිරට | ඃ | මු.පි. මාර 252හි කැබලි අංක 01 හා මු.පී. 704හි කැබලි අංක 02 (පවතින කුරුඳු වගාවේ වපසරිය අ. 02, රූ. 01, පර්. 06කි) |

**චින්තක අබේවික්‍රම,**
ප්‍රාදේශීය ලේකම්.

2020 දෙසැම්බර් මස 09 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.